# අඳුරට සාප කරනවා වෙනුවට එක පහනක් හෝ දල්වමු

## සහෝදර චාල්ස් තෝමස්



**මලක් වුණේ ඇයි නුඹ මට**
**ජීවිතයට සුවඳ සලන**
**එනමුදු සිපගන්නට තහනම්**
**විලක් වුණේ ඇයි නුඹ මට**
**ජීවිතයට සිසිළ ඉසින**
**දිය දෝතක් බොන්නට තහනම්**

**සමන් අතාවුදහෙට්ටි අතින් ලියැවී අමරසිරි පීරිස් ගයකයානන් ගේ ගැඹුරු හ පෞරුෂය හා මුසුවුණ අපූරු ගීයේ මේ පද කිහිපය ඔස්සේ වෙනස් ම වූ මානයකට අප සිතුවිලි මොහොතකට යොමු කෙරුණි. මලක් නම් එහි සුවඳ විඳිමින් සිපගන්නට ඉඩ දිය යුතුවාක් මෙන්ම, විලකින් දිය දෝතක් බොන්නට, පවස නිවාලන්නට විලට සොභා දහමෙන් පැවරෙන්නාවූ යුතුකම විල ඉටුකළ යුතු වූවාක් මෙන්ම, මනුෂ්‍යයන් වූ අපට මිනිස්කමේ සුවඳ සිසිළ අපෙන් ලබාගන්නට ඉඩ දීමෙන් වැළකිය හැකිද යන ප්‍රශ්ණය ඔහු අප හමුවේ තැබුවේය. ගසක් එල දරන්නේ ඒ එල නෙලා ගන්නා අයට කොන්දේසි පැනවීමකින් තොරවය.. මුළු ගසේම එල නෙලාගත්තත් පොලු ගසා ගෙඩි කඩා ගත්තත් ඒ ගස නැවතත් එල දරනු ඇත... ගසේ පැවැත්ම කොන්දේසි විරහිතව ලබා දෙන ගසේ එල නිසාවෙන්ම තහවුරු වෙන සොභාදහමේ අපූරුව ගැනත් එවන් ප්‍රතිලාභ නොපතන පරිත්‍යාගශීලීත්වයක් මිනිසුන් තුල කොතරම් දුරකට තිබේදැයි යන පැණයද ඔහු අප හමුවේ තැබුවේ සුපුරුදු සිනාමුසු මුහුණෙන් යුතුවය. කන්කළු ගැඹුරු හ කින් ඇසුණු මේ ගී පද පෙළත්, ඒ ඇසුරෙන් කෙරුනු අපූරු විග්‍රහයකුත්, සමගින් ගෙවුනු හෝරා කිහිපයක අවසානයේ සිතන්නට යමක් ඉතිරි කර අපෙන් සමුගන්නට ප්‍රථමයෙන්, ඔහු හා සොඳුරු සංවාදයක යෙදෙන්නට මට අවස්ථාව උදා වුණා. ඔහු නමින් චාල්ස් තෝමස්. බොහෝ දෙනා හඳුනන පරිදි ඔහු බ්‍රද්ර් චාල්ස් ය. ලාංකිකයන් තුල යහපත් ආකල්පමය වෙනසක් ආධ්‍යාත්මික සිතුවිලි පිබිදවීමක් කරන්නට යම් ප්‍රයත්නයක යෙදෙන මේ අපූරු සහෘදයා සමග කෙරුනු සංවාදය මෙසේ දිග හරිමි.**

**බ්‍රද්ර් චාල්ස්, ඇත්තෙන්ම ඔබ කවුද?**

මම සාමාන්‍ය මනුස්සයෙක්....බිරිඳක් හා දරුවකු සිටින විවාහකයෙක්......මම ජේසුස් වහන්සේගේ දහම හා උන් වහන්සේව පිළිගන්නා, දෙවියන් වහන්සේ විශ්වාස කරනා කතෝලිකයෙක්

**එතකොට ඔබ ආගමික පූජකවරයෙකු හෝ යම් ආකාරයක ආගමික නායකයෙකු නොවෙයි ඒ කියන්නෙ?**

කොහෙත්ම නෑ.. මම මා උපන් රටට ආදරය කරන, ඒ රට අද තිබෙනා තත්වයෙන් ඉහළට පැමිණ භෞතිකවත් ආධ්‍යාත්මිකවත් වඩාත් යහපත් තත්වයකට පත්වෙනවා දැකීමට අවංකවම කැමති ලාංකිකයෙක්.

**ඔබ දැනට වසර ගණනාවක සිටම සිංහල ගීත ගායනා හා ගීත විචාර සමගින් ඔබටම ආවේණික වූ ආකරයකින් ඒ ගී පදවැල් ඔස්සේ මිනිසුන්ගේ හදවත් වලට කතා කරන කඳුළ නමින් වූ වැඩසටහනක් ශ්‍රී ලංකාව තුලත් විදෙස් රටවල ශ්‍රී ලාංකිකයින් අතරත් පවත්වාගෙන යනවා. මොකක්ද මේ වැඩසටහන් මාලාවේ අරමුණ?**

ජීවිතය පිළිබඳව ගැඹුරෙන් හිතන්න, තමා තුලට එබී බලන්න, නිදා වැටෙන සිතුවිලි අවදි කරවන්න හැකියාව ඇති අරුත්බර පදමාලවන් සහිත විශිෂ්ඨ ගීත සාහිත්‍යයක් අප සතුව තිබෙනවා. අවාසනාවකට මුදල් වියදම්කර බලෙන් ගී අස්සවා ජනප්‍රිය කරවන, හුදෙක් ඉක්මණින් මුදල් ඉපයීමේ පරමාර්ථය මතම රින්ග් ටෝන් සඳහා ගීත නිර්මාණය වෙන අද වගේ යුගයක ඒ අගනා ගී රස වින්දනය අපෙන් ඈත්වෙලා. ඒ නැතිවී යන රස වින්දනය කෙරෙහි ලාංකිකයින් යොමු කරවන ගමන්ම ඔවුන් තුල රටේත් ඔවුන්ගේත් යහපත ඉලක්ක කරගත් ආධ්‍යාත්මික හා ආකල්පමය සංවර්ධනයක් ඇතිකිරීම තමයි ලකඳුළල කියන මේ වැඩසටහන් මාලාවේ මූලික අරමුණ. මේ ඔස්සේ අපේ රට වඩාත් යහපත් තැනකට ඔසවා තබන්නට හැකි වෙයැයි මා විශ්වාස කරනවා. මේ උත්සාහය අගයන ඊට දිරි දෙන ශ්‍රී ලාංකික පිරිසක් ජාති ආගම් භේධ වලින් තොරව රට තුලත් ලොව පුරා අන් රටවලත් විශාල වශයෙන් මේ වෙනකොටත් එකතු වී තිබෙනවා.

**මේ කඳුළ වැඩසටහන ඔස්සේ ඔබ කරනා දේශණා තුලදී බුදුන් වහන්සේගේ දර්ශණය පිළිබඳවත් බුදුදහමේ ඉගැන්වීම් පිළිබඳවත් ඔබ පැහැදීමකින් යුතුව කතාබහ කරන බවක් දකින්න ලැබෙනවා. බොහෝවිට බුදුදහම ඇසුරු කර ගනිමින් යම් යම් කරුණු කාරණා පැහැදිළි කරනව. මේ හේතුවෙන්ම ඔබට විවිධ පාර්ශවවල විවේචන පවා ඇතැම්විට එල්ල කෙරෙනවා. මේ විවේචන හා චෝදනා සම්බන්ධයෙන් ඔබේ ස්ථාවරය කුමක්ද?**

මා කලින් කිව්වාක් මෙන්ම මා කතෝලිකයෙක්.....දෙවියන් වහන්සේ විශ්වාස කරන්නෙක්.....ජේසුස් වහන්සේ ජීවිතයට සමීප කරගත් කෙනෙක්. නමුත් බුදුන් වහසේගේ දේශණා හා උන්වහන්සේ ගැන පැහැදීමක් ගෞරවයක් ඇති කෙනෙක්. මැවුම්වාදය හා හේතුඵලවාදය අතර පවතින පැහැදිළි වෙනස්කම් හා නොගැළපීම් ඇති බව දන්නා මුත් ඒ සියල්ලට වඩා මේ දහම් දෙක තුලම ඉගැන්වෙන මිනිස්කම් හා යහපත් ගුණාංග ඉස්මතුකරවා ඒවා හරහා සියළුදෙනා තුළම යම් ආධ්‍යාත්මික පිබිදීමක් ඇතිකර ඒ ඔස්සේ රටට යහපත් හෙට දිනක් උදාකරලිය හැකි බව මා තදින්ම විශ්වාස කරනවා. ලංකාව බෞද්ධ රටක්. එය ඉදිරියේදීත් එසේම විය යුතුයි. මා එසේ කියන්නේ බුද්ධ දර්ශණය තුළ ජීවමාන වන නිදහස් චින්තනයත් මානුෂීය බවත් පවතින වටපිටාවක, අන් සියළු ආගමිකයින් සුරක්ෂිතයි. අන් කිසිම ආගමක් ප්‍රධාන ආගම වූ වටපිටාවක ඒ නිදහස බලාපොරොත්තු විය නොහැකියි. පෘතුගීසීන් ලන්දේසීන් හා ඉංග්‍රීසීන් ඇතුළු බටහිරයින් හරහා ජේසුස් වහන්සේගේ දහම අප රටට පැමිණි බව සත්‍යයක් වුවත් ඔවුන්ගෙන් රටට වූ හානිය නිවැරදි කරවන්නට කිතුනුවන්ට මෙතෙක් නොහැකි වී ඇති බවත්, ඒ සියල්ල මැද බෞද්ධ ජන සමාජයේ යහපත් බව නිසාම අන් සියළු ආගමිකයින්ට නිදහසේ තම ආගම් අදහමින් අපේ රටේ ජීවත් වීමට හැකියාව ලැබී තිබෙන බවත් පිළිනොගන්නවා නම් මා කුහකයෙකු විය යුතුයි.

මගේ මේ ස්ථාවරය නිසාවෙන් ම, හා මා බුදුන් වහන්සේ ගැන පැහැදීමකින් කතාකිරීම හේතුවෙන් පළවෙනි පනත බිඳ දැමූවෙකු ලෙස හුවා දක්වමින් ක්‍රිස්තියානි සමාජයේ ඇතැමුන්ගෙනුත්, බුදුන්ගේ දර්ශණය වර්ණනා කරමින් බෞද්ධයින් කතෝලික ආගමට හරවාගන්න උත්සාහ කරන්නෙකු ලෙසින් බෞද්ධ සමාජයේ ඇතැමෙක්ගෙනුත් මට විවිධ චෝදනා ගර්ජන තර්ජන එල්ල වෙනවා. අවාසනාවකට ලංකාවෙ මිනිසුන් තුළ විවිධ පාර්ශවවල උවමනා නිසා බෙදීමේ මානසිකත්වයක් බිහිවී තිබෙනවා. ඔවුන්ට මැදිහත්භාවය අද ආගන්තුක දෙයක් වෙලා. බෙදිය හැකි සියල්ලෙන්ම බෙදී වෙන්වෙන්නට දඟලන මිනිස්සු මැදිහත් ප්‍රවේශයක් ගන්නා අයෙකුට පහරදීමට පෙළඹීම ස්වභාවිකයි. කෙසේ නමුත් පැහැදිළිවම කිව යුතු දේ තමයි මා කතෝලිකයෙකු ලෙසින් පෙනීහිටිමිනුයි මේ සියල්ල කරන්නෙ. ඉදිරියෙදිත් මා කතෝලිකයෙක්මයි. ආගම් වලට හැරවීම කියන කාරණයට මා තදින්ම විරුද්ධ කෙනෙක්. මට සමහරෙක් එල්ල කරන චෝදනාවක් තමයි මම එන්.ජී.ඕ. එකකින් මුදල් ලබාගෙන මේ දේවල් කරන බවට. මං හිතන්නේ මේ ආකරයෙන් අපේ රටේ මිනිසුන් ගැන විශේෂයෙන් යහපත්

41 වන පිටට

සාකච්ඡා කලේ
පාලිත ඉද්දමල්ගොඩ